
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

Phone : 0 2 0 7 4 2 8 9 3 8 8
Fax : 0 8 7 1 9 0 0 5 1 6 3
E-mail : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
Editor : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
Art : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
Computer Graphics : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
Photography : Ananda Kariyawasam



# ධර්මය කැලෑවට ගියේය!

1981 අගෝස්තු මස 1 දින අපවත් වී වදාළ සංඝපිතෘ පූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ මහා නා හිමියන් වහන්සේ විසින් ලියන ලද ඉතා වටිනා ලිපියක් මම කියවා ඇත්තෙමි. එහි මාතෘකාව - **ධර්මො වනාන්තර ගත:** (ධර්මය වනාන්තරයට ගියේය) යන්නයි. එහි සඳහන් කරුණු හැම මොහොතකම වාගේ මට සිහිපත් වේ. වර්තමාන ලෝකයේ ජීවත්වන අප කාටත් මාහැඟි පණිවුඩයක් උන්වහන්සේ ඉන් ප්‍රකාශ කොට තිබුණි. ඥාණසීහ මහා නාහිමියන් තව කලක් ජීවත්වූයේ නම් ජනසමාජය සකසන්නට තවත් කොපමණ දේ ලියනවා ඇද්ද?


තාක්ෂණික මෙවලම් ගැන මුළු ලෝකයම ප්‍රහර්ෂයට පත්ව සාඩම්බරකමින් කතා කරන යුගයකි මේ. බැලූ බැලූ තැනක හැම කෙනෙකු අතම, කුඩා දරුවන් ළඟ පවා, මොබයිල් පෝන යක් ඇත. ඔවුන් හැම විටම ඉන්නේ සංවාද-යේ යෙදිලා ය. බසයට නගින්නේද කාට හෝ කතාකරමිනි. බොහෝ විට එම කතාව අසා සිටින අයට ඉමහත් පීඩාවකි. එහෙත් අනික් අය ගැන තඹයක තැකීමක් මොවුනට නැත. තවත් බොහෝ දෙනෙකුගේ කන් දෙකට ඇබ දෙකක් ගසා තිබේ. ඉන් එල්ලෙන වයර් දෙකකි. ඔව්හු ඇස් පියාගෙන තනිවම ඔළුව වනමින් සිටිති. ඒ සිය අළුත්ම **mp3** මෙවලමට වෙබ් අඩවියකින් ඩවුන්ලෝඩ් කරගත් රැප් සංගීත-යෙන් මත්වී වෙනම ලෝකයක සිටින අද තරුණ පෙළයි. අවට මොනවා වෙනවා දැයි ඔවුන් දන්නේ නැත. දැනගන්නට උවමනාවක් ද නැත. මේ තාක්ෂණිකව මහා දියුණුවක් ලබා ඇති අද අප ජීවත්වන ලෝකයයි.

මෙසේ තාක්ෂණික ගැජට් දියුණුවන පම-ණට අද ලෝකයේ මනුෂ්‍යයාත් දියුණුවිය යුතු නොවේද? ඇත්තටම එසේ සිදුවී ඇද්ද?

එංගලන්තයේ පාසැල් දරුවන් පාසැලට යන්නේ උල් පිහි අතේ ඇතිව ය. එය අඹගෙඩි යක් කපාගන්නට හෝ පැන්සලක් උල්කරගන්-නට හෝ නොවේ තමාගේම වයසේ තවත් ළමයෙකුට අනින්නටය. වයස අවුරුදු දහයේ පිරිමි ළමයි තනිවම හෝ කීප දෙනෙක් එක-තුව කුඩා ගැහැණු ළමයින් දූෂණය කළ අවස්ථා රැසක් නොබෝදා එංගලන්තයේ සිදුවී ඇත. කුඩා දරුවෝ ලිංගික චිත්‍රපට තම මොබයිල් පෝනයට කම්පියුටරයට කවාගෙන බලති. මත් බෙහෙත් ගනිති. තරුණ ළමයින්ගේ දිනපතා කතාකරන භාෂාව **f** අකුරෙන් යුක්ත ය.

වැඩිහිටියෝ කුඩා දරුවන් කෙළෙසති. ගනිකා වෘත්තිය අද ඉහළම සහ ලාභ ලබන රැකියාව බවට පත්ව තිබේ. එයට වයස් සීමා වක් නැත. ලෙඩරෝග හැදෙන, අහිතකර ආහාර නිපදවා ඒවා ජනයාට කවා මරණය ළඟා කරවා ලාභ ලබති. තව තව පොළව හාරා තෙල් උල්-පත් පාදා පරිසරය ද, සත්ව ජීවිත ද විනාස කරති. එක රටක් අනික් රට නැති කරන්නට න්‍යෂ්ටික ආයුධ තනති. දියුණුයයි කියන රට වල් වල දැන් ලොකුම නිශ්පාදනය ආයුධ ය. ඒ නිසාම ත්‍රස්තවාදය නසනවාට අද හුඟ දෙනෙක් කැමති නැත. ත්‍රස්තවාදය නැතිකරන අයට විරුද්ධව කටයුතුකරන්නට අද එක්සත් ජාතීන් පවා සූදානම් ය. කරුණු මෙසේ නම් ධර්මය කැලෑ වදින එක අහන්නට දෙයක්ද?

# පහන් සුවෙන් පිරී පොහොන් මහ



**දො**ළොස්මහ පහන් ටැඹේ අපේ හෙළතලයට ඉතාමත් දීප්තිමත් පහන් සිළුව වනුයේ පෙසොන් නමැති පහන් සිළුවය. එය අපේ පැලේ පිලේ ඇත්තන් වහරණුයේ පොහොන් මහ නමිනි. පොහොන් මහ වූ කලී සිංහල මාස් රටාවේ තෙවැනි මාසය වන අතර වත්මන් මාස් පටිපාටියේ සවැනියට යෙදී ඇති ජුනි මාසය වෙයි. ගිම්හාන සෘතු ගත මෙම මාසය අන් මාස වලට වඩා ශාරීරික මානසික සුවය එළවන සුළු ප්‍රසන්න කාලගුණික රටාවකින් ගෙත් තම්වූ මාසයක් වශයෙන් ය හැඳින්විය හැක්කේ. වසන්ත ගීතයෙන් එය අනූනවූ නිසාම තුරු ලතාවෝද මලින් එලින් ආයිත්තම් වී මුළු මහත් පරිසරයම හැඩවැඩ ගන්වති. එසේම වාපි ජාලයේ මල්වර සමය ලෙසටය පොසොන් මස නම්වන්නේ.

පොසොන් යනු නෙළුම්වලට යෙදෙන නාමයකි. නෙළුම් වැව් විල් පුරා පිපෙන මාසය පොසොන් නම් වී. ඊට ගැමිහු නෙළුම් මාසයයි ද වහරති. මඳ මඳ සුළඟේ කඩින් කඩ විසිරී යන සිහින් වැසි පොද බෙහෙවින් දකිනු හැකිවනුයේද පොසොන් මාසයේ ය. එහෙයින් මල් වැසි මාසයයයි ඊට නම් වී ඇත්තේ පොසොන් වැසි මල්වැසි නමින් හැඳින්වෙන හෙයින්ම ය.

එමෙන්ම පොහොන් යයි ඊට නම්වන්නේ කෘෂි රටාවට ආවේණික තත්වයක් මේ මාසය තුළ දිස්වන හෙයිනි. යල් මෝසමට වගාකරන බාල වී වර්ගවල පොහොනා බව (බණ්ඩි අවධිය) සිදුවන් නේද, හේන් තල වගාවේ අධිවර්ධනයද (තල මල් සහිත ගස් කරල් ඇල්ලීමත් සමග වේගවත් වර්ධනයක යෙදෙන්නේද) පොහොන් මහේ මැයි. ඒ අනුව පොහො-නා, පොහොන් යන්නේ අරුත හුදෙක්ම වැඩී වර්ධනය යන්න බව ධර්ම සමය සිංහළ ශබ්දකෝෂයේද සනාථ වෙයි.

තවද පොහොන් යනු ශාරීරික සුවය වැඩෙන ආහාර පාන සඳහා යෙදෙන පර්යාය පදයකි. පදාර්ථ, පොහොර, පෝෂණය යන්නට ඒ පදය නෑකම් කියයි. වන පලතුරුවලින්ද, මලින් බර හෙයින්ද, මීපැණිවලින්ද, සුවබර කාලගුණික තත්වය පාදක නකරගත් ශාරීරික සුවයෙන්ද හෙබි මාසය වූයේ පොහොන් මහමය.

එපමණක් ද නොවේ. චිරන්තන අපේ සමාජ රටාව ජනවිඥාණය තුළින් කෙමෙ-න් කෙමෙන් වියැකෙන්නට වූයේ සම්බුද් ධෝත්තම සදහම් ආනන්දයේ අනුහසින් බව නොරහසකි. ඒ සදහම් ආශීර්වාදය අප දේශයට වැඩම කෙරුණු උත්තම මාසය වන්නේද පොසොන් මාසය බව මිහිපුර වාසීහුම දනිති.

එදා මහ වාසලෙන් සමාරම්භවී පැලපිළ දක්වා රොතු බැඳී තිබුණු අසත් වයඹියා පදාසයන් පිරිපහදු වූයේ මහින්දා ගමනයෙන් දායාද වූ ශ්‍රී සද්ධර්මයේ පූරිත මෙත් මුදිතා සිලිලාරයෙන්ය. එතැන් සිට කැලේ නීති, රජේ නීති ආදියෙහි පැලපැදියම් වී තිබුණු, පරඝාතක සංස්කෘතියෙන් කිතිකැවී ගිය, ගලක් මෙන් දැඩිව පැවති මිනිස් ලියමඬුළු, මලක් මෙන් මෙලෙක් වූයේ අම්බස්තලයට සැපත් අනුබුදු මාහිමියන්ගේ මහාර්ඝ ධර්ම දූත මෙහෙවරයේ උදාවෙනි.

ඒ උත්තරීතර දහම් උදාව සිදුවූ මහින්දාගමන පුණ්‍යසාර මාසය මෙම පොහොන් මහ වන්නේමය. එනිසාම පසන් හෙවත් ප්‍රසන්න මාසය ද විය.

අපි අවිච්ින්නවූත්, පෞඪවූත් ඉතිහාසයකට උරුම කරුම ඇත්තෝ වෙමු. ඒ සුපූජිත ඉතිහාසය අපට දායාද වූයේ මහින්දාගමනයෙන් සමාරම්භ වූ බෞද්ධාගමෙනි. අප දේශය සන්තක වූ සත්චර්යාවන්ගෙන් පෝෂිත සකල විධ සංස්කෘති-කාංගයෝ ඒ උත්තම බොදු දහම සමග නැගම් ආවෝ වෙත්. ඒ අති උතුම් නෑ ගමන සිදුවුණු බෞද්ධ ඉතිහාසයේ ස්වර්ණාක්ෂරයන්ගෙන් ලියැවී ඇති ඓතිහාසික මාසය වන්නේද පොසොන් මාසයයි. ඒ නයින්ද පොසොන් මාසය අන් සෑම මසකටම වඩා සුවිශේෂ වනු නියති.

♦ **කේ. බී. මානෑව**
**Sri Lanka**

# සසර දැඩි බැඳීම අඹුදරුවන්ට බැඳීමයි

නතං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජං ච
සාරත්තරත්තා මණිකුණ්ඩලේසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙඛා

The wise do not say that bonds made of iron, of wood and of hemp are strong bonds. They say that only passionate attachment to and care for gems and jewellery, children and wives are the strong bonds.

These drag one down (to lower planes of existence) and although they seem yielding are difficult to unfasten. The wise cutting off this bond (of craving ) and resolutely giv-ing up sensual pleasures, renounces the world.

**- Dhammapada**



යකඩින් කරන ලද්දාවූත්, දැවයෙන් කරන ලද්දා වූත්, බබුස් තණින් හෙවත් සැවැන්දරා වැල් වලින් ගෙතූ ලණු වලින් බැඳ කරන ලද්දාවූත් යම් බන්ධන යක් වේද, ඒ සියළු බැඳීම් බුද්ධාදී ප්‍රාඥයෝ බැඳීම් යයි නොකියත්.කෙනෙකුට මැණික්වලින් විසිතුරු කරන ලද කුණ්ඩලා හරණ ආදියෙහිද, දරුවන් හා භාර්යාව ඇතුළු පවුලටද ඇති බැම්ම වඩාත් දැඩි බැම්මක් වන්නේය.

**ධම්මපදය**
**345 ගාථාව**

# ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

## හිතොපදේශයෙන්

**අලසස්‍ය කුත: ශිල්පමශිල්පස්‍ය කුතො ධනම්**
**අධනස්‍ය කුතො මිත්‍රමමිත්‍රස්‍ය කුත: සුඛම්**

***අර්ථය** : කම්මැලි තැනැත්තාට කවර නම් ශිල්පයක්ද? ශිල්පයක් නොදන්නාහට කවර නම් ධනයක්ද? ධන නැත්තාහට කවර නම් සැපයක්ද?*

අලසකම, කුසීතකම, ක්‍රියාශීලී නොවීම යන නම් වලින් හැඳින්වෙන මෙම කම්මැලිකම පුද්ගලයා මානසික මෙන්ම කායික වශයෙන්ද අක්‍රිය පුද්ගලයෙකු බවට පත්කරයි. අලසකම පිරිහෙන පුද්ගලයෙකුගේ ලක්ෂණයකි. ඉතා පහත් මානසික මට්ටමකි. කටයුතු පමාවීමටත්, අවුල්වීමටත්, ඔහුට සමාජයේ කිසිදු විශ්වාසයක් දිනාගැනීමටත් නොහැකි තත්වයකි.

ජාතක සාහිත්‍යයේ එන වරණ ජාතකය මෙසේය. එක් ඇදුරුතුමෙකුට සිසුන් විශාල පිරිසක් සිටියහ. පසුදින පාන්දර දුර ගමනක් යැමට ඔවුන්ට සිදුව තිබුණි. එම ගමනට පෙර අළුයම ආහාරය ගැනීමට ඔවුන්ට නියමව තිබූ නිසා පසුදා පාන්දර කෑම පිළියෙල කිරීම සඳහා දර ගෙන ඒමට සිසුන් පිරිසක් වනයට ගියහ. මේ අය අතර එක් අලස සිසුවෙක්ද වීය. මොහුට කොළ හැලුණු ලුණුවරණ ගසක් දකින්නට ලැබුණි. නින්දක් ලබා අන් අය දර රැස්කරගෙන අවසන් වූවාට පසු ඉක්මනින් අර ගසින් දර කඩාගෙන යා හැකියයි සිතා ගහ මුළ නිදාගත්තේය. අනෙක් අය දර ද ගෙන ආපසු යන්නට සැරසෙන බව දැක වහා නැගිට ගහේ අතු කීපයක් කඩාගෙන මිටියක් බැඳගෙන ඔවුන් සමග ගොස් දර මඩුවේ අන් අයගේ දර මිටිවලට උඩින්ම දැමුවේය. කෑම පිසින කාන්තාවද කෑම පිසීමට ගත්තේ එම දරය. පැය ගණනක් ගිනි මෙළවීමට උත්සාහ කළද ඉන් පලක් නොවීය. හිරු ද උදාවිය. කල් ගත වූ නිසා ගමන යෑමද ඉන් වැළකුණි. මෙම ජාතක කතාවෙන් කියැවෙන්නේ එක් කම්මැලියෙකු තමන්ට මෙන්ම ආශ්‍රයකරන් නන්ටද අයහපත සිදුකරන බවයි.

මෙහි අනෙක් පැත්ත උදෙ‍්‍යාගය උත්සාහය වීර්යය ආදියයි. සියළු කාර්‍යයන් සඵලකරගන්නේ එකී ගුණවලින් යුතු අයයි. එදානෙදා කුදු මහත් කටයුත්තේ සිට උත්තරීතර බුදුබව දක්වා වුවද වීර්‍යය අත්‍යවශ්‍යය. ඉහත පද්‍යයට අනුව අලසයාට ශිල්ප සාධනය කළ නොහැකි බව සඳහන් වෙයි.

දෙවැන්න ශිල්ප නොදන්නාට කවර ධනයක්ද යන්නයි. ධනෝපායන මාර්ගයක් ලෙස කුමන හෝ ශාස්ත්‍රයක් දැන ගෙන සිටිය යුතුයි. එය හුදෙක් පොතටම සීමා වූ දැනුමක් නොවිය යුතුයි. ඉන් බැහැර වූ වෙනත් ශිල්ප ශාස්ත්‍ර පිළිබඳ අවබෝධය හා ඒවා ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීමේ හැකියා-වයි. මෙහිදී වැදගත් වන්නේ ජීවන වෘත්තිය ලෙස තමා ලබා ඇති දැනුම උපයෝගී කරගනිමින් ධනය ඉපැයීමයි. එනිසා සෑම තැනැත්තෙක්ම එකක් හෝ ඊට වැඩි යමක් ඉගෙනීම තම ජීවිකාව පහසුවෙන් කරගෙන යෑමට මහත් රුකුලක් වන්නකි.

ධනය නැත්තාට මිතුරන් නැත යන්න තෙවැන්නයි. ධනය නැත්තාට අනෙක් භෞතික සම්පත් මෙන්ම නෑදෑ හිත මිතුරන්ද අඩුවීම අරුමයක් නොවේ. පල රහිත ගස, ජලය රහිත විල සියළු පක්ෂීන් හැරයන්නාක් මෙන් ධනය නැත්තාද අනෙක් අය විසින් හැරයනු ලබන බව සංස්කෘත උපදේශ සාහිත්‍යයේ එන කියමනකි. අලි වග වලසුන් වැනි වන සතුන් සමග ජීවත්වීමත්, වන පලාපල අනුභවකිරීමත්, වල්කල දරමින් තණබිම් මත නිදීමත් ආදී දේ ධනයෙන් තොරව නෑදෑයින් සමග ජීවත් වෙනවාට වඩා උතුම් බව තවත් පද්‍යයක සඳහන් වෙයි. එහි අදහස ධනය නැතිවිට හැම දෙනාම හැර යන බවයි. ධනය තිබේ නම් මිතුරන් නෑයින් ඇතිවන බවත් ඔහු නියම පුද්ගලයෙකු මෙන්ම උගතෙකු වශයෙන්ද ලොව පිළිගන්නා බවත් උපදේශ සාහිත්‍යයේ සඳහන්ය.

අවසනට දැක්වෙන්නේ මිතුරන් නැත්තාට සැපයක්ද නැති බවයි. පිය මිතුරන් නොමැති ජීවිතය ඉතා නිසරු වූවකි. කඳාතීන් අතර හොඳම කඳාතියා ලෙස හැඳින්වෙන මිතුරන් නොමැති ජීවිතය හිඩැස් වූවකි. දුක සැප දෙකේදීම අප අත්හැර නොයන සෙවනැල්ල මෙන් සිටින මිතුරෙකු නිසා දැනෙන සහනය අන් අය ගෙන් ලැබිය නොහැකිය. අපගේ ජීවිතයට හොඳ කළණ මිතුරන් ලැබීම භාග්‍යයකි.



♦ **රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**
***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
***ලන්ඩන් බෞද්ධ විහාරය***

**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

*Colombo Office*
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632